| | |
|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | |

දිනය / திகதி / Date. 2025.06.19

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

**<u>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.</u>**

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව සිදු කරනු ලබන විමර්ශනයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම වගඋත්තරකාර පාර්ශවයන් බැඳී සිටී. තවද මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරිමට අදාලව 17/2005 හා 2005.10.05 අංක හා දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය මඟින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සංස්ථාපිත මණ්ඩල ප්‍රධානින් දැනුවත් කර ඇත. එමෙන්ම මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය අනුව නිර්දේශයේ සඳහන් කාලය ඇතුලත ඒ නිර්දේශය බලාත්මක කිරීම පිණිස ඒ තැනැත්තා විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙස නියම කරනු ලැබීය යුතු අතර, ඒ අනුව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම ඒ සැම තැනැත්තකුගේම යුතුකම විය යුතුය යනුවෙන් පැහැදිලිව දක්වා ඇත.

එහෙත් කොමිෂන් සභා නිර්දේශ නිකුත් කිරීමෙන් පසු එම නිර්දේශ ක්‍රියාත්මක නොවීම් පිළිබඳ විමසීම් කිරීමේදී සමහර ආයතන හා/හෝ නිලධාරින් ප්‍රකාශ කර ඇත්තේ, ඒ පිළිබඳ අභියාචනා ඉදිරිපත් කර ඇති බැවින් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති බවයි. ඒ අනුව අභියාචනයක් ඉදිරිපත් කිරීම මත නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති බව නිරික්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව ලබා දෙනු ලබන නිර්දේශ සඳහා නැවත අභියාචනා කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් අභියාචනා යොමු කරමින් නිර්දේශ ක්‍රියාත්මක නොකර සිටිමට නීතිමය හැකියාවක් නොමැති බව සියලුම පාර්ශවයන් දැනුම්වත් විය යුතු බව අවධාරණය කරමි.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක නොකරන්නේ නම් ඊට එරෙහිව කොමිෂන් සභාව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අදාල නිලධාරින් හා ආයතන වගකීමට යටත් වනු ඇති බව සියලුම පාර්ශවයන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව මේ පිළිබඳ ඔබ යටතේ පවතින ආයතන හා නිලධාරින් අභ්‍යන්තර චක්‍ර ලේඛ මගින් ලිඛිතව දැනුම්වත් කිරිමට පියවර ගෙන ඒ පිළිබඳ මෙම කොමිෂන් සභාවට 2025.06.30 දිනට පෙර ලිඛිත වාර්තා ඉදිරිපත් කරන ලෙස දන්වමි.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

R/-


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>தலைமைக் காரியாலயம்<br>Head Office | 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.<br>14, R.A.De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 2505541/74 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>E-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11- 2505580/81/82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2505575<br>1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 17/2005

මගේ අංකය : ආ/1/1/2/4/1
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2005.10.[illegible]

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

<u>මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයන් ඉටුකිරීමේදී රාජ්‍ය ආයතනවල සහාය ලබා දීම</u>

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතෙහි 10 වන වගන්තිය මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පවරා ඇති කර්තව්‍ය අතරින් පහත සඳහන් කර්තව්‍යයන් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

(අ) මූලික අයිතිවාසිකම්වලට අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන අනුව ක්‍රියා කරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම හා ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක හා පරිපාලනමය පිළිවෙත් හා කාර්ය පටිපාටි පිළිබඳව සුපරීක්ෂාවෙන් සිටීම ;

(ආ) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳ විභාග කිරීම හා විමර්ශනය කිරීම සහ මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට අනුකූලව සමථයට පත්කිරීමේ හා සමගි කිරීමේ මාර්ගයෙන් ඒවා විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ඇ) මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටි සකස් කිරීමෙහි ලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහාය වීම ;

මානව හිමිකම් කොමිසම විසින් ඉහත කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී ඔබ ආයතනයට අදාල වන කාර්යයන් සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණ වලදී එම කොමිෂන් සභාව වෙත වගකීමකින් යුතුව කරුණු ඉදිරිපත් කරන ලෙසත්, මානව හිමිකම් කඩවීම සම්බන්ධව කොමිෂන් සභාව කරනු ලබන නිර්දේශ ඔබ වෙත ලැබුනු විට එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විධිමත් අනුමැතිය අදාල බලධාරීන්ගෙන් ලබාගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු බවත් මෙයින් දන්වමි.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

T-cir/md